# අධ්‍යාපන අමාත්‍යාංශය

# නිපුණතා සංවර්ධන,වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

# කෑගල්ල පුරවර විශ්වවිද්‍යාලය

# (කොන්ත්‍රාත් පදනම මත පුරප්පාඩු පිරවීම)

මෙරට තරුණ ප්‍රජාව සඳහා නොමිලේ උසස් අධ්‍යාපන අවස්ථා උදාකර දීම තුළින් අනාගත අභියෝග ජයගත හැකි නිපුණතාවන්ගෙන් සවිබල ගැන්වූ නව උපාධිධාරීන් පරපුරක් බිහිකරලීමේ අරමුණින්, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක නිපුණතා සංවර්ධන,වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය විසින් කෑගල්ල පුරවර විශ්වවිද්‍යාලය ස්ථාපනය කිරීමට කටයුතු කෙරිණි. මෙම ව්‍යාපෘතිය අංක 2209/14 සහ 2021.01.04 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන හා අනුකූලව ක්‍රියාත්මක කරනු ලැබේ. කෑගල්ල පුරවර විශ්වවිද්‍යාලය මඟින් පහත සඳහන් උපාධි පාඨමාලා පැවැත්වීම සඳහා පියවර ගනු ලැබේ.

1. පසු අස්වනු කළමනාකරණ සහ අගයන් එක්කිරීමේ තාක්ෂණ පීඨය
   i. පසු අස්වනු කළමනාකරණය සහ අගයන් එක්කිරීමේ තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධිය
2. තිරසර සංචාරක සහ සත්කාරක සේවා ව්‍යාපාර පීඨය
   i. තිරසර සංචාරක සහ සත්කාරක විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිය
3. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පීඨය
   i. තොරතුරු තාක්ෂණ සේවා කළමනාකරණ තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධිය
   ii. ස්වයංක්‍රියකරණ සහ දත්ත විශ්ලේෂණ තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධිය
   iii. බහුමාධ්‍ය තාක්ෂණයන් පිළිබඳ ගෞරව උපාධිය

පහත තනතුරු පුරවාලීම සඳහා කොන්ත්‍රාත් පදනම මත සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. සප්ත වාර්ෂික නිවාඩු සඳහා හිමිකම් සහිත පුද්ගලයින් මෙම තනතුරු සඳහා අයදුම් කිරීමට දිරි ගන්වනු ලැබේ.

**01. පරිපාලන අංශය**

i. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (1 ශ්‍රේණිය ) (කොන්ත්‍රාත් පදනම මත )
ii. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ( II ශ්‍රේණිය) (කොන්ත්‍රාත් පදනම මත)
iii. කථිකාචාර්ය(කොන්ත්‍රාත් පදනම මත)
iv. සහකාර ලේඛකාධිකාරී (කොන්ත්‍රාත් පදනම මත)
v. සහකාර මූල්‍යාධිකාරී (කොන්ත්‍රාත් පදනම මත)
vi. කාර්මික නිලධාරී (කොන්ත්‍රාත් පදනම මත)
vii. කළමනාකාර සහකාර

**02. පසු අස්වනු කළමනාකරණ සහ අගයන් එක්කිරීමේ තාක්ෂණ පීඨය**

i. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ( Iශ්‍රේණිය) (කොන්ත්‍රාත් පදනම මත)
ii. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ( IIශ්‍රේණිය) (කොන්ත්‍රාත් පදනම මත)
iii. කථිකාචාර්ය (කොන්ත්‍රාත් පදනම මත)
iv. ප්‍රදර්ශක (කොන්ත්‍රාත් පදනම මත)

**03. තිරසර සංචාරක සහ සත්කාරක සේවා ව්‍යාපාර පීඨය**

i. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ( Iශ්‍රේණිය) (කොන්ත්‍රාත් පදනම මත)
ii. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ( IIශ්‍රේණිය) ( කොන්ත්‍රාත් පදනම මත)
iii. කථිකාචාර්ය (කොන්ත්‍රාත් පදනම මත)
iv. ප්‍රදර්ශක (කොන්ත්‍රාත් පදනම මත)

**04. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පීඨය**

i. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ( Iශ්‍රේණිය) ( කොන්ත්‍රාත් පදනම මත)
ii. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ( IIශ්‍රේණිය) (කොන්ත්‍රාත් පදනම මත)
iii. කථිකාචාර්ය (කොන්ත්‍රාත් පදනම මත)
iv. ප්‍රදර්ශක (කොන්ත්‍රාත් පදනම මත)

**වැටුප :-**

- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ( Iශ්‍රේණිය) - Rs 91,310 + 7,800 (දීමනාව )
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ( II ශ්‍රේණිය) - Rs. 79,360 + 7,800 (දීමනාව)
- කථිකාචාර්ය - Rs. 69,580 + 7,800 (දීමනාව)
- සහකාර ලේඛකාධිකාරී - Rs 50,625 + 7,800 (දීමනාව)
- සහකාර මූල්‍යාධිකාරී - Rs 50,625 + 7,800 (දීමනාව)
- ප්‍රදර්ශක - Rs 40,920 + 7,800 (දීමනාව)
- කාර්මික නිලධාරී - Rs 31,625 + 7,800 (දීමනාව)
- කළමනාකාර සහකාර - Rs 30,725 + 7,800 (දීමනාව)

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)**

1. මෙහි සඳහන් කර ඇති කථිකාචාර්ය තනතුර (කොන්ත්‍රාත් පදනම මත) සඳහා අවශ්‍ය ශාස්ත්‍රීය සුදුසුකම් අදාළ අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු වන අතර,
2. අවම වශයෙන් වසර 2ක පූර්ණ කාලීන පර්යේෂණ කාලසීමාවක් සහිතව අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ ලබාගත් ආචාර්ය උපාධියක් හෝ පශ්චාත් උපාධි සුදුසුකමක් (Masters Degree) සතුවිය යුතුය. සිය පශ්චාත් උපාධි/පර්යේෂණ අධ්‍යයනයන්හි ප්‍රතිඵල ලෙස නවෝත්පාදන/නවනිපැයුම් වැඩිදියුණු කරනු ලැබූ අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය පිරිනැමේ. **හෝ**
3. පුරවර විශ්වවිද්‍යාලයේ අනුමැතිය හිමිවන අන්දමේ අදාළ ක්ෂේත්‍රය පිළිබඳසනාථ කළ හැකි සාර්ථකත්වයන් සහිත වෘත්තීය සුදුසුකම් සහ/හෝ කර්මාන්ත අංශයේ පළපුරුද්ද **සහ**
4. පශ්චාත් උපාධිය හිමිකර ගැනීමෙන් අනතුරුව පහතින් සඳහන් කර ඇති අංශයන් එකක් හෝ වැඩි ගණනක් සම්බන්ධයෙන් අවම වශයෙන් වසර හයක (06) පළපුරුද්දක් සතුවීම :
   i. විශ්වවිද්‍යාල මට්ටමින් ඉගැන්වීම ,
   ii. වෘත්තීය පළපුරුද්ද ,
   iii. පිළිගත් ආයතනයක පර්යේෂණයන්හි නියැලීම,
   iv. ඉහත(2) හි නියම කරනු ලැබ ඇති සුදුසුකම් සපුරාගනු පිණිස පශ්චාත් උපාධි අධ්‍යයන සිදුකිරීම.

**සටහන් :**

(අ) ඇගයුමට ලක්කළ පර්යේෂණ සහ ව්‍යාප්ත කිරීම හා සම්බන්ධිත පවත්නා මාර්ගෝපදේශ වනුයේ අපේක්ෂකයෙකු විසින් අවම වශයෙන් ලකුණු 15ක මුළු ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතු බවත් ආශ්‍රිත මහාචාර්ය/මහාචාර්ය තනතුර සඳහා වන ලකුණු දීමේ පටිපාටියෙහි 2.0 සහ 3.1 වගන්තීන් මේ සඳහා අදාළ කර ගත යුතු බවත්ය.

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (IIශ්‍රේණිය)**

5. මෙහි සඳහන් කර ඇති කථිකාචාර්ය තනතුර (කොන්ත්‍රාත් පදනම මත) සඳහා අවශ්‍ය ශාස්ත්‍රීය සුදුසුකම් අදාළ අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු වන අතර,
6. අවම වශයෙන් වසර 2ක පූර්ණ කාලීන පර්යේෂණ කාලසීමාවක් සහිතව අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ ලබාගත් ආචාර්ය උපාධියක් හෝ පශ්චාත් උපාධි සුදුසුකමක් (Masters Degree) සතුවිය යුතුය.සිය පශ්චාත් උපාධි /පර්යේෂණ අධ්‍යයනයන්හි ප්‍රතිඵල ලෙස නවෝත්පාදන/නවනිපැයුම් වැඩිදියුණු කරනු ලැබූ අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය පිරිනැමේ. **හෝ**
7. පුරවර විශ්වවිද්‍යාලයේ අනුමැතිය හිමිවන අන්දමේ අදාළ ක්ෂේත්‍රය පිළිබඳ සනාථ කළ හැකි සාර්ථකත්වයන් සහිත වෘත්තීය සුදුසුකම් සහ/හෝ කර්මාන්ත අංශයේ පළපුරුද්ද

**සහ**

8. උපාධිය හිමිකර ගැනීමෙන් අනතුරුව පහතින් සඳහන් කර ඇති අංශයන් එකක හෝ වැඩි ගණනක් සම්බන්ධයෙන් අවම වශයෙන් වසර හයක (06) පළපුරුද්දක් සතුවීම :
   v. විශ්වවිද්‍යාල මට්ටමින් ඉගැන්වීම,
   vi. වෘත්තීය පළපුරුද්ද,
   vii. පිළිගත් ආයතනයක පර්යේෂණයන්හි නියැළීම,
   viii. ඉහත (2) හි නියම කරනු ලැබ ඇති සුදුසුකම් සපුරාගනු පිණිස පශ්චාත් උපාධි අධ්‍යයනයන් සිදුකිරීම.

**සටහන:**

**කථිකාචාර්ය**

1. අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ පළමු හෝ දෙවන පන්තියේ (ඉහළ පෙළ)සාමාර්ථයක් සහිත විශේෂ ගෞරව උපාධියක් සතුවීම සහ අවම වශයෙන් වසර 03ක ඉගැන්වීම්/පර්යේෂණ/ වෘත්තීය පළපුරුද්දක් තිබීම. **හෝ**
2. අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දෙවන පන්තියේ (පහළ පෙළ) සාමාර්ථයක් සහිත විශේෂ ගෞරව උපාධියක් සතුවීම සහ අවම වශයෙන් වසර 04ක ඉගැන්වීම්/පර්යේෂණ/වෘත්තීය පළපුරුද්දක් තිබීම. **හෝ**
3. අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ විශේෂ ගෞරව උපාධියක් හෝ අවම වශයෙන් දෙවන පන්තියේ සාමාර්ථයක් සහිත වෙනත් උපාධියක්,සහ අදාළ කර්මාන්ත අංශය පිළිබඳ සනාථ කළ හැකි සාර්ථකත්වයන් සහිතව අවම වශයෙන් වසර 05ක පළපුරුද්දක් තිබීම. **හෝ**
4. පුරවර විශ්වවිද්‍යාලයේ අනුමැතිය හිමිවන අන්දමේ, අදාළ ක්ෂේත්‍රය පිළිබඳ සනාථ කළ හැකි සාර්ථකත්වයන් සහිත ශාස්ත්‍රීය හෝ වෘත්තීය සුදුසුකම් හෝ වෘත්තීය/කර්මාන්ත අංශයේ පළපුරුද්ද

**සහකාර ලේඛකාධිකාරී**

අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් පළමු හෝ දෙවන පන්තියේ උපාධියක් හිමිව තිබීම. **හෝ**

ආ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් උපාධියක් සමග පරිපාලනය/කළමනාකරණය** පිළිබඳ පශ්චාත් උපාධියක්/පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සතුවීම.

**වයස :** අවුරුදු විසිදෙකට (22) නොඅඩු සහ අවුරුදු තිහට (30) නොවැඩි විය යුතුය.

- රාජ්‍ය/ව්‍යාපාර කළමනාකරණය
- කළමනාකරණය
- රාජ්‍ය ප්‍රතිපත්ති
- මානව සම්පත් කළමනාකරණය
- ආර්ථික විද්‍යාව
- නීතිය
- මූල්‍ය කළමනාකරණය
- ව්‍යාපෘති සැලසුම්කරණය සහ කළමනාකරණය
- තොරතුරු තාක්ෂණය
- සැලකිය යුතු අන්දමේ කළමනාකරණ/පරිපාලන සංරචකයන් ඇතුළත් වෙනත් විෂය ක්ෂේත්‍රයන්

**සහකාර මූල්‍යධිකාරී**

1. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් පවත්වනු ලබන අවසාන II විභාගය හෝ ඒහා සම තත්ත්වයේ විභාගයක් සමත්ව තිබීම. **හෝ**

(අ) (i) පිළිගත් විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් ගිණුම්කරණය පිළිබඳ විශේෂවේදී උපාධියක් ලබා තිබීම. **හෝ**

(ii) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් පවත්වනු ලබන අන්තර්මධ්‍ය (Intermediate level) විභාගය හෝ ඒ හා සම තත්වයේ විභාගයක් සමත්ව තිබීම සමග පිළිගත් විශ්වවිද්‍යාලයකින් /උසස්අධ්‍යාපන ආයතනයකින් උපාධියක් ලබා තිබීම. **හෝ**

(iii) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) හෝ එයට පූර්වයෙන් ක්‍රියාත්මක වූ ආයතනය විසින් පවත්වනු ලැබූ ගිණුම්කරණ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDA) හිමිව තිබීම **සහ**

(ආ) රජයේ/රාජ්‍ය සංස්ථාවක හෝ පෞද්ගලික අංශයේ පිළිගත් ආයතනයක ගිණුම්කරණය/ විගණනය පිළිබඳ වසර දෙකක (02) පළපුරුද්දක් සතු වීම

**ප්‍රදර්ශක**

(අ) ප්‍රධාන විෂය ලෙස අදාළ විෂය ක්ෂේත්‍රය හැදෑරූ විද්‍යාවේදී උපාධිධරයෙකු වීම **හෝ**

(ආ) අදාළ ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂවේදී උපාධිධරයෙකු වීම **සහ**

(ඉ) අදාළ ක්ෂේත්‍රය හා සම්බන්ධව අවම වශයෙන් වසරක(01)ඉගැන්වීම්/වෘත්තීය පළපුරුද්ද.

**කාර්මික නිලධාරී**

අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාව යටතේ එකවර විද්‍යා විෂයයන් තුනක් (3ක්) සමත්ව තිබිය යුතුය; අදාළ අංශයෙන් ලබාදෙනු ලබන නිර්දේශ මත අදාළ පීඨය විසින් විෂය සංයුතිය/සංයුතීන් තීරණය කෙරෙනු ඇත. **සහ**

තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිසම විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් හෝ තොරතුරු සන්නිවේදන හා බහුමාධ්‍ය තාක්ෂණ/තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ /තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරනු ලැබූ NVQ5 මට්ටමට සමාන හෝ ඊට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් හිමිව තිබීම.

**කළමනාකාර සහකාර**

පහත සඳහන් විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. සා/පෙළ විෂයයන් හයක් (06) එකවර සමත්වීම :-

i. සිංහල භාෂාව /දමිළ භාෂාව
ii. ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍යය
ii. ගණිතය

**සහ**

2. අ.පො.ස. උ/පෙළ විභාගයේදී එකවර සියලු විෂයයන්(සාමාන්‍ය පොදු පරීක්ෂණය හැරුනු කොට) සමත්ව තිබිය යුතුය.

   (පැරණි විෂය නිර්දේශය යටතේ විෂය 3ක් එකවර සමත්ව තිබීම මේ සඳහා ප්‍රමාණවත් වේ)

3. පහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ;
   අ) පිළිගත් ආයතනයකින් පිරිනමනු ලැබූ මාස හයක (06) කාල සීමාවකට නොඅඩු පරිගණක යෙදවුම් පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක් **සහ**
   ආ) පරිගණක යෙදවුම් පැකේජ භාවිතය පිළිබඳ වසර 2ක පළපුරුද්ද

**සැ.යු: - සුදුසුකම්**

අ) ශ්‍රී ලාංකීය පුරවැසියෙක් විය යුතුය.

ආ) අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා ලබාදී ඇති අවසාන දිනයට වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 30 නොඉක්මවූ අයෙකු විය යුතුය.

ඇ) මනා චරිතයකින් හෙබි අයෙකු විය යුතුය.

ඉහත තනතුරු සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන අයදුම්කරුවන්ට අදාළ ආදර්ශ අයදුම්පත හා විස්තර පත්‍රිකා නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් (http://skillsmin.gov.lk) බාගත (Download)කළ හැකිය. නිපුණතා සංවර්ධන,වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ ඇතුළත්ත පුරප්පාඩු විස්තර පත්‍රිකා අධ්‍යයනය කරන මෙන් අදාළ අයදුම්කරුවන්ට තවදුරටත් උපදෙස් දෙනු ලැබේ.

සම්පූර්ණ කරන ලද අයදුම්පත, අදාළ අධ්‍යාපන සුදුසුකම් (විස්තරාත්මක උපාධි සහතික සමග) වෘත්තීය හා සේවා සහතිකවල පිටපත් හා වෙනත් සුදුසුකම්වලට අදාළ සහතිකවල පිටපත්, ලේකම්, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය,354/2 , "නිපුණතා පියස"ඇල්විටිගල මාවත, කොළඹ 05. යන ලිපිනයට 2022 මාර්තු 04 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත බහා එවනු ලබන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා හා අනෙකුත් ආයතනවල අයදුම් කරන ස්වකීය ආයතන ප්‍රධානියා මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ආයතන ප්‍රධානියා මඟින් එවනු ලබන අයදුම්පතෙහි අමතර පිටපතක් දී ඇති ලිපිනයට එවීමට කටයුතු කරන්න.

නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ඇගයීමට භාජනය නොවනු ඇත. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේකම්,**
**නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය,**
**නො.354/2 , "නිපුණතා පියස",**
**ඇල්විටිගල මාවත, කොළඹ 05.** 2022.02.20